ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය
කොළඹ

මාධ්‍ය නිවේදනය

මාතලේ මොරගහකන්ද පාලම ඉදිකිරීම ඇරඹේ

ශ්‍රී ලංකාවේ ඉන්දීය මහ කොමසාරිස් අතිගරු සන්තෝෂ් ජා මැතිනුමා සහ ප්‍රවාහන, මහා මාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍ය බිමල් රත්නායක මැතිනුමා විසින් අද දින මාතලේ මොරගහකන්ද පාලම ඉදිකිරීම සඳහා මූලගල තබන ලදී.

2. පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්, මාර්ග සංවර්ධන අධිකාරියේ ජයෂ්ඨ නිලධාරීන් සහ තවත් සම්භාවනීය අමුත්තන් රැසක් මමෙ අවස්ථාවට සහභාගී වූහ.

3. මොරගහකන්ද පාලම ඉන්දීය රජයේ ප්‍රදාන යටතේ ශ්‍රී ලංකාවේ විවිධ දිස්ත්‍රික්ක පුරා ඉදිකරෙනෙ පාලම් 13න් පළමු පාලම වේ. මමෙ ව්‍යාපෘතිය දිවා සුළි කුණාටුවනේ බලපෑමට ලක් වූ ප්‍රදේශයන්හි යටිතල පහසුකම් ප්‍රතිෂ්ඨාපනය කිරීමේ අරමුණින් ඉන්දියාව විසින් පිරිනමන ලද ඇමරිකානු ඩොලර් මිලියන 450ක නැවත ඉදිකිරීමේ සහ පුනරුත්ථාපන පැකේජයේ කොටසකි.

4. ප්‍රදේශයේ මාර්ග සම්බන්ධතා ප්‍රතිෂ්ඨාපනය කිරීමහෙලා ඇති වැදගත්කම සලකමින් ශ්‍රී ලංකා රජය විසින් සිදු කළ විශේෂ ඉල්ලීමක් අනුව මොරගහකන්ද පාලමට ප්‍රමුඛතාවය ලබා දනෙ ලදී. දිගින් මීටර් 175කට අධික නව පාලම මාතලේ සහ පොලොන්නරුව දිස්ත්‍රික් අතර වැදගත් මාර්ග සම්බන්ධතාවයක් ස්ථාපිත කරමින් ප්‍රදේශයේ ජනතාවගේ ප්‍රවාහන කටයුතු පහසු කරනු ඇත.

5. ශ්‍රී ලංකාවේ දිගු කාලයක් පුරා කටයුතු කර තිබෙන ඉන්දීය රාජ්‍ය අංශයේ සමාගමක් වන IRCON ඉන්ටර්නැෂනල් ලිමිටඩ් විසින් පාලම ඉදිකරනු ඇත.

6. මොරගහකන්ද පාලමේ කටයුතු ආරම්භ කිරීමනේ අනතුරුව ඉතිරි පාලම් 12 හි ඉදිකිරීම් කටයුතු ඉදිරි සතිවලදී ආරම්භ කිරීමට අපේක්ෂිතය.

7. දිව්වා සුළි කුණාටුවනේ හානියට පත් මාර්ග සබඳතා කඩිනම්ව ප්‍රතිෂ්ඨාපනය කිරීම සඳහා ඉන්දියාව දැනටමක් ස්ථාන 10ක බේලි පාලම් 11ක් ඉදිකර ඇත. ස්ථිර පාලම් ඉදිකිරීමේ වැඩසටහන සමාරම්භ කිරීම තුළින් හදිසි ප්‍රතිෂ්ඨාපන කටයුතුවල සිට ස්ථිර සහ ඔරොත්තු දෙන යටිතල පහසුකම් දක්වා මාරුවීම සිදුවන්නේ.

8. පාලම් වැඩසටහනට අමතරව, දුම්රිය ක්ෂේත්‍රයට අදාළ ව්‍යාපෘතීන් කිහිපයක් ද ඉන්දියානු රුපියල්වලින් නාමනය කරන ලද ඇමරිකානු ඩොලර් මිලියන 250ක දිගුකාලීන ණය පහසුකම යටතේ නුදුරේදීම ඇරඹීමට අපේක්ෂිතය. පේරාදෙණියේ නව දුම්රිය පාලමක් ඉදිකිරීම සහ දුම්රිය මාර්ග සහ ඒ ආශ්‍රිත සංඥා පද්ධතීන් ප්‍රතිසංස්කරණය කිරීම මයෙට ඇතුළත් වේ.

9. මොරගහකන්ද පාලමේ ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීම තුළින් මනාව ඔරොත්තු දෙන යටිතල පහසුකම් ගොඩනැගීම සහ සම්බන්ධකතාවය ශක්තිමත් කිරීම සඳහා ශ්‍රී ලංකාවට සහය දීම උදෙසා ඉන්දියාවේ අඛණ්ඩ කැපවීම පිළිබිඹු කරයි. මමෙ මුලපිරීම් දිවයින පුරා ජනතාව සඳහා දැනනෙ ප්‍රතිලාභ ගනෙ දීමේ අරමුණින් ක්‍රියාත්මක ඉන්දියාවේ දිගුකාලීන, ජනතා කේන්ද්‍රීය සංවර්ධන සහයෝගීතාවයේ කොටසකි.

***

කොළඹ

2026 සැප්තැම්බර් *21*